
# 12 ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය

## ප්‍රසාද ස්නාපනය




12.1 රූපය - ජේසුස් වහන්සේගේ හා බිළිඳකුගේ ප්‍රසාද ස්නාපනය

ස්වර්ග රාජ්‍යයට ඇතුළු වීමට නම් අප ප්‍රසාද ස්නාපනය ලැබිය යුතු බව ජේසුස් වහන්සේ නිකදේමුස්ට වදාළ වචනවලින් සනාථ වේ:

> යමෙක් වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යට පිවිසිය නොහැකි ය.
>
> (ජොහන් 3:5)

එලෙස ඉගැන්වූ ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීමට පෙර තම අපෝස්තුලුවරුන්ට අණ දුන්නේ ද සියලු ජාතීන් ශ්‍රාවකයන් කර ඔවුන් ව බෞතීස්ම ස්නාපනය කිරීමට යː

> ඔබ ගොස්, සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න; පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බෞතීස්ම ස්නාපනය කරන්න; මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න. මම ද යුගායන්තය දක්වා සදහට ම ඔබ හා සමග සිටිමි.
>
> (මතෙව් 28:19-20)

**ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද**

- ජන්ම හා කර්ම පාපයන්ට සමාව හා ඒවාට නියමිත දඬුවම්වලට සමාව
- දේව දරුකම ලැබීම
- ශුද්ධ ත්‍රිත්වය එම පුද්ගලයා තුළට වැඩම කිරීම
- ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් වීම
- දේව රාජ්‍යයේ පංගුකාරත්වය ලැබීම
- අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම සඳහා සුදුස්සකු වීම
- පූජක, එඬේරික හා දිවැසිවර දූත කාර්යයන්ට හවුල්කරුවන් වීම
- අතිඉන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ අවයවයන් බවට පත් වීම
- ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වය ලැබීම

> ප්‍රසාද ස්නාපනයේ මාර්ගයෙන් ඔබ ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයක් වූයෙහි ය. බරපතල පාපයක් කිරීමෙන් ඒ සා මහත් සම්භාවනීය තැනැත්තකු ඔබගේ හෘදයෙන් පළවා නොහරින්න.
>
> (ශුද්ධ වූ මහා ලියෝ ශුද්ධෝත්තම පියතුමා)

## ආත්මික මව්පියකු වීමට තිබිය යුතු සුදුසුකම්

- ★ ආරම්භක දේව ප්‍රසාද නිධාන (ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදය) ලබා තිබිය යුතු ය.
- ★ අවුරුදු 16 ඉක්මවා ගිය අයකු විය යුතු ය.
- ★ තමන්ගේ විශ්වාසය ජීවත් කරවන හා තමන්ගේ කාර්යභාරය ගැන අවබෝධයක් තිබිය යුතු ය.
- ★ ශුද්ධ වූ සභාව විසින් ප්‍රකාශ කරන ලද කිසි ම දඬුවමකට යටත් නොවූවකු විය යුතු ය.
- ★ දරුවාගේ දෙමාපියන් විසින් අනුමත කරනු ලැබුවකු විය යුතු ය.
- ★ ඔවුන්ට හිමි කාර්යභාරයන් ඉටු කිරීමට කැමැත්ත හා හැකියාව තිබිය යුතු ය.
- ★ දරුවාගේ දෙමව්පියන් නොවිය යුතු ය.

## ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සංකේතාත්මක ද්‍රව්‍ය හා ඒවායේ අර්ථ

**ජලය :** ජලය, ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන හා අනිවාර්ය සංකේතය යි. ලෝකය මැවීමේ දී ජලය ඒ සඳහා දායක වූවා සේ ප්‍රසාද ස්නාපනයේ දී නව උපතක් සඳහා ජලය දායක වේ (ජොහන් 3:5). ලෝකාරම්භයේ දී ජලය මතු පිට දේවානුභාවය හැසුරුණු ලෙස (උත්පත්ති 1:2). ජේසුස් වහන්සේ ව ප්‍රසාද ස්නාපනය කරන විට උන්වහන්සේ මත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ සිටි සේක (මාක් 1:10).

**සුදු වස්ත්‍රය :** සුදු වර්ණය පිරිසිදුකමේ සලකුණකි. සුදු වස්ත්‍රය දරුවාගේ ශරීරය මත තැබීමෙන් හෝ ඇන්දවීමෙන් දරුවා ලබන ආත්මික පිරිසිදුකම සංකේතවත් කරයි. පාපයට පෙර මිනිසා වරප්‍රසාදීය ජීවිතයක් ගත කළ අතර පාපයෙන් පසු එම වරප්‍රසාදීය ජීවිතය අහිමි විය. ප්‍රසාද ස්නාපනයේ දී අඳිනු ලබන සුදු වස්ත්‍රය මගින් නැවත වරප්‍රසාදීය ජීවිතයකට ඔසවනු ලැබීම සංකේතවත් කරයි. සුදු වස්ත්‍රය අන්‍ය රූපවිලාශ වීමේ දී ක්‍රිස්තුන් වහන්සේ ඇඳ සිටි ධවල වස්ත්‍රය ද සංකේතවත් කරයි. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ ඇඳුමේ සංකේතය යි (මතෙව් 28:2-3). ප්‍රසාද ස්නාපනය තුළින් අපි උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ මහිමයට පංගුකාර වෙමු.

ආලේප කිරීම : "ක්‍රිසම්" (Chrism) හෙවත් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් කැප කරනු ලබන ක්‍රිස්මා තෛලයෙන් ප්‍රසාද ස්නාපනය දනය කිරීමේ දී ආලේප කරනු ලැබේ. ආලේප කිරීමෙන් සංකේතවත් කරනුයේ ශක්තිමත් කිරීම යි. කිතුනුවකු සේ ශක්තිමත් කරනු ලබන්නේ;

- තම විශ්වාසය අනුව ජීවත් වීමටත්,
- තම විශ්වාසයට එරෙහි ව යමක් ඇති වුවහොත් එයට විරුද්ධ ව සටන් කිරීමටත් ය.

ප්‍රසාද ස්නාපනය ලබන කිතුනුවා ද පූජකයකු, දිවැසිවරයකු හා රජ කෙනෙකු වශයෙන් දෙවියන් වහන්සේට හා මිනිසාට සේවය කිරීමට ආලේප කරනු ලැබේ.

පාස්කු ඉටි පහනඃ පාස්කු ඉටි පහන උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ සලකුණ යි. මෙහෙය තුළ දල්වා තිබෙන පාස්කු ඉටි පහන මගින් දරුවාගේ ආත්මයට ලැබෙන උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ ආලෝකය සංකේතවත් කරයි. ක්‍රිස්තුන් වහන්සේ ව අනුගමනය කරන කිසිවකු අඳුරේ ගමන් නොකරන බවද දරුවා ආලෝකයේ දරුවකු වූ බව ද ආලෝකය තුළ නිතර ගමන් කළ යුතු බව ද සංකේතවත් කරයි (ජොහන් 8:12).

## අභිවෘද්ධි ආලේපය




12.2 රූපය - රදගුරුතුමා අභිවෘද්ධි ආලේපය දනය කිරීම

### ගැලවීමේ ඉතිහාසය තුළ අභිවෘද්ධි ආලේපය

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයෙන් ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය වෙන් කළ නොහැකි ය. උන්වහන්සේ පිළිසිඳ ගත්තේ ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙනිඃ

දාවිත්ගේ පුත් ජොසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට බිය නොවන්න. මන්ද, ඈ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි.

(මතෙව් 1:20)

දේව දූතයා මරිය තුමියට මෙසේ කීවේ යː

ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසාගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක!

(ලූක් 1:35)

ජේසුස් වහන්සේ ස්නාවක ජොහන් තුමා අතින් ජොර්දන් නදියේ දී බෞතීස්මය ලැබූ අවස්ථාවේ දී ශුද්ධාත්මයාණන් වහන්සේ පරවියකු විලාශයෙන් උන්වහන්සේ මත වැඩම කළ සේක. උන්වහන්සේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භයේ දී මෙසේ වදාළ සේකː

ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන් වහන්සේ මා ආලේප කළ සේක.

(ලූක් 4:18)

ශුද්ධාත්මයාණන් වහන්සේ අපෝස්තුලුවරුන් වෙත වැඩම කළ විට ඔවුන් කෙසේ ක්‍රියා කරනු ඇත්දැයි උන්වහන්සේ මෙසේ පෙන්වා දුන් සේකː

ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නාහු ය. එවිට ඔබ ජෙරුසලමෙහි ද මුළු ජුදයෙහි හා සමාරියෙහි ද පොළොවේ සීමාන්තයන් දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහු ය.

(ක්‍රියා 1:8)

**අභිවෘද්ධි ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම්**

- ⋆ ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
- ⋆ නියමිත වයස (අවුරුදු 14) සම්පූර්ණ කර තිබීම
- ⋆ ඉෂ්ට වරප්‍රසාද තුළ ජීවත් වීම (ඉෂ්ට වරප්‍රසාදය තුළ අභිවෘද්ධි ආලේපය ලබා ගැනීම සඳහා සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගත යුතු ව ඇත)
- ⋆ නිසි ධර්මෝපදේශයක් ලබා තිබීම
- ⋆ අභිවෘද්ධි ආලේපය ලැබීමට ඇති කැමැත්ත
- ⋆ ක්‍රිස්තුන් වහන්සේගේ හේවා භටයෙකු වීමට සූදානම් වීම
- ⋆ විශ්වාසය ප්‍රකාශ කිරීම (ප්‍රසාද ස්නාපන පොරොන්දු අළුත් කිරීම)

**අභිවෘද්ධි ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද**

- ⋆ අභිවෘද්ධි ආලේපය තුළින් ප්‍රසාද ස්නාපනීය වරප්‍රසාද ගැඹුරු වීමකුත්, වර්ධනය වීමකුත් සිදු වේ.
- ⋆ ශුද්ධ වූ සභාවේ පූර්ණ සමාජිකත්වය ලැබේ.
- ⋆ දිව්‍යමය දාරකත්වයකින් "අබ්බා පියාණනි" කියා අමතනු ලැබීමට හැකි වේ.
- ⋆ ක්‍රිස්තුන් වහන්සේ සමග තිරසාර ව ඒකාබද්ධ කරන්නේ ය.
- ⋆ අප තුළ ශුද්ධාත්ම දීමනා වැඩි වර්ධනය කරන්නේ ය.
- ⋆ ශුද්ධ වූ සභාව හා සමග ඇති සබැඳියාව, වඩා පූර්ණත්වයක් කරා ගෙන යන්නේ ය.
- ⋆ පරිණත කිතුනුවකු හා ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ සාක්ෂිකරුවකු ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් විශ්වාසය පැතිර වීමට ශුද්ධාත්මයාණන්ගේ විශේෂිත වූ ශක්තිය ලැබීම.
- ⋆ ක්‍රිස්තුන් වහන්සේගේ නාමය නිර්භය ව ප්‍රකාශ කරන්නටත්, කිසි විටෙක කුරුසිය පිළිබඳ ලැජ්ජා නොවන්නටත් ශක්තිය ලැබීම
- ⋆ සමාජයේ ඇති දූෂිත දේවලින් ආරක්ෂා වීමටත්, ජීවිතයට පැමිණෙන අභියෝග හමුවේ නොසැලී සිටීමටත්, එම අභියෝගවලට නොබිය ව මුහුණදීමටත් ශක්තිය හා ධෛර්ය ලැබේ.
- ⋆ සමාජයේ විවිධ අවස්ථා හා තත්ත්ව යටතේ දී දිවැසිවර කාර්යයෙහි යෙදෙමින් සත්‍යය, සාධාරණත්වය, සහෝදරත්වය ගැන එඩිතරව ප්‍රකාශ කිරීම.

**අභිවෘද්ධි ආලේපය දානය කරන්නා;**

අභිවෘද්ධි ආලේපය දානය කරන ප්‍රථම නිල සේවකයා විය යුත්තේ රාජගුරුප්‍රසාදින් වහන්සේ ය. වැඩිහිටි ප්‍රසාද ස්නාපනයේ දී පූජාප්‍රසාදින් වහන්සේ විසින් එම පිළිවෙතේ දී ම අභිවෘද්ධි ආලේපය දානය කරනු ලැබේ. කිසියම් හෙයකින් කිතුනුවකු මරණීය අවදානමක සිටින්නේ නම් ඕනෑ ම පූජාප්‍රසාදීන් වහන්සේ කෙනෙකුට මෙම දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ අවසරය ඇත.

**ක්‍රියාකාරකම**

1. පහත සඳහන් අවස්ථාවල දී අභිවෘද්ධි ආලේපය ලබා සිටින ඔබ ක්‍රියා කරන ආකාරය ලියන්න.

| අවස්ථාව | ප්‍රතිචාරය |
|---|---|
| විශ්වාසයට ප්‍රසිද්ධියේ ගරහන විට දී | ............................................<br>............................................ |
| අසභ්‍ය දේවල්වලට තමන් ව යොමු කර ගැනීමට උත්සාහ දරන විට දී | ............................................<br>............................................ |
| සත්‍ය කථා කළ යුතු අවස්ථාවක දී | ............................................<br>............................................ |

2. ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සංකේතාත්මක ද්‍රව්‍ය හා ඒවායේ අර්ථ වගුගත කරන්න.
3. අභිවෘද්ධි ආලේපයෙන් ලැබුණු වරප්‍රසාද වර්ධනය කර ගැනීමට ඔබ කළ කාර්යයන් තුනක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

*මාගේ විශ්වාසයට හා පිරිසිදුකමට අභියෝග පැමිණෙන විට "ක්‍රිස්තු සේවා භටයකු" මෙන් සටන් කරමි.*